# කාලිංග මාඝ ආක්‍රමණයෙන් ලංකාවට සිදු වූ බලපෑම

ඩබ්ලිව්. ඕ. කේ. එම්. එන්. විජේසිංහ
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
mithila.nayomi93@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව විදේශයන් සමඟ පැවැත් වූ සම්බන්ධතාවල ප්‍රතිඵලයක් ලෙස විදේශ ආක්‍රමණ රැසක් මෙරටට එල්ල විය. එකී ආක්‍රමණවලින් සුවිශේෂී ආක්‍රමණයක් ලෙස කාලිංග මාඝ ආක්‍රමණය හැඳින්විය හැකි ය. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ කාලිංග මාඝ ආක්‍රමණයෙන් ලංකාවට සිදු වූ බලපෑම පිළිබඳව හා කාලිංග මාඝ ආක්‍රමණයෙන් මිදීම සඳහා එවකට සිටි පාලකයින් අනුගමනය කළ ප්‍රතිපත්ති පිළිබඳ විමසා බැලීම යි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම ද්විතීය සාහිත්‍යමය මූලාශ්‍රය යොදා ගනු ලැබී ය.

ක්‍රි. ව. 1215 දී කාලිංග දේශයේ සිට පැමිණි මාඝ නම් වූ ආක්‍රමණිකයා මෙරටට එල්ල කළ ආක්‍රමණය හේතුවෙන් රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට ලක් විය. කාලිංග මාඝ මෙරට ආක්‍රමණය කරන විට පාලකයා බවට පත් වී සිටියේ පරාක්‍රම පාණ්ඩ්‍ය රජතුමා ය. පරාක්‍රම පාණ්ඩ්‍ය රජුට කාලිංග මාඝව විනාශ කිරීමට නොහැකි වූ නිසා එවකට සිටි පාලකයින් ප්‍රාදේශීය පාලන ඒකක පිහිටුවාගෙන නිරිතදිගට සංක්‍රමණය විය. මාඝගේ මේ ආක්‍රමණය හේතුවෙන් මෙරටට දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික වශයෙන් විශාල බලපෑමක් එල්ල විය. එහිදී මාඝ විසින් විශාල වශයෙන් මිනිස් ජීවිත හා දේපල විනාශ කිරීම, වෙහෙර විහාර විනාශ කිරීම, පොත්පත්වලට ගිනි තැබීම, කෘෂිකර්මාන්තය අඩපණ කිරීම වැනි විනාශකාරී ක්‍රියාවන් රැසක් සිදු කළේ ය. මේ නිසා රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට ලක් වූ අතර මෙරට අරාජික තත්ත්වයක් ද ඇති විය. මේ ආකාරයට කාලිංග මාඝගේ ආක්‍රමණය හේතුවෙන් මෙරටට විශාල විනාශයක් සිදු වූ අතර එමඟින් දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික බලපෑම් රැසක් සිදු වූ බව මෙමඟින් ප්‍රස්තුත වේ.

**ප්‍රමුඛ පද : -බලපෑම, කාලිංග මාඝ, විදේශ ආක්‍රමණ, පරාක්‍රම පාණ්ඩ්‍ය, සංස්කෘතිය.**